මාධ්‍ය නිවේදනය

## ශ්‍රී ලංකා ආර්ථිකය 2019 වර්ෂයේ පළමු කාර්තුවේ දී සියයට 3.7 කින් වර්ධනය වේ.

ජාතික ගිණුම් ඇස්තමේන්තු; 2019 වර්ෂයේ පළමු කාර්තුව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දු.ක. 94-11-2147071 ෆැක්ස්: 94-11-2877938 ඊමේල්: national.accounts@statistics.gov.lk

..............................................................................................................

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 පළමු කාර්තුව (ජනවාරි, පෙබරවාරි, මාර්තු) සඳහා දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක නිෂ්පාදන ප්‍රවේශය අනුව පවත්නා මිල ගණන් යටතේ සහ ස්ථාවර මිල ගණන් (2010) යටතේ ඇස්තමේන්තු කර නිකුත් කොට ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන පරිදි 2019 පළමු කාර්තුව සඳහා ඇස්තමේන්තු කර ඇති ආර්ථික වර්ධන වේගය සියයට 3.7 කි. මෙම වසරේ පළමු කාර්තුව සඳහා ස්ථාවර මිල (2010) ගණන් යටතේ ඇස්තමේන්තු කරනු ලැබූ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 2,326,273 කි. තව ද පසුගිය වසරේ පළමු කාර්තුවේ දී මෙම අගය රුපියල් මිලියන 2,242,552 ක් විය.

ආර්ථිකයේ ප්‍රධාන සංරචක වන කෘෂිකර්මය, කර්මාන්ත, සේවා සහ භාණ්ඩ මත අය කෙරෙන සහනාධාර අඩුකල බදු 2019 වර්ෂයේ පළමු කාර්තුවේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය පිළිවෙලින් සියයට 6.9 ක්, සියයට 31.6 ක්, සියයට 53.9 ක් සහ සියයට 7.7 ක් ලෙස වාර්තා වේ.

කෘෂිකාර්මික ආර්ථික කටයුතු 2019 වර්ෂයේ පළමු කාර්තුවේ දී සියයට 5.5 ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. තව ද කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 3.0 ක ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර සේවා අංශයේ ආර්ථික කටයුතු සියයට 4.1 කින් වර්ධනය වී ඇත.

ප්‍රධාන කෘෂිකාර්මික ආර්ථික කටයුතු අතුරින් “වී වගා කිරීම” 2019 වර්ෂයේ පළමු කාර්තුවේ දී සියයට 13.1 ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. තව ද “පොල් වගාව ඇතුළත් තෙල් සහිත බෝග වගාව” පෙර වර්ෂයේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 15.7ක සෘණ වර්ධනයට සාපේක්ෂව සියයට 35.6ක කැපී පෙනෙන ධන වර්ධනයක් වාර්තා කර ඇත. එසේ ම මෙම කාර්තුවේ දී “සත්ව නිෂ්පාදන”, “පළතුරු වගා කිරීම”, “පැළ බෝ කිරීම සහ කෘෂි උපකාරක සේවාවන්” සහ “එළවළු වගා කිරීම” යන කෘෂිකාර්මික ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 9.4 ක්, සියයට 8.1 ක්, සියයට 6.9ක් සහ සියයට 4.7 ක් වශයෙන් සැලකිය යුතු ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. කෙසේ වෙතත් 2019 පළමු කාර්තුවේ දී “වී හැර අනෙකුත් ධාන්‍ය වගා කිරීම”, “කරදිය ධීවර කටයුතු” සහ “තේ වගා කිරීම” පසුබැසීම් වාර්තා කර ඇත.

කර්මාන්ත ආර්ථික කටයුතු අතුරෙන් “ඉදිකිරීම්” සහ “පතල් හා කැනීම්” පිළිවෙලින් සියයට 6.9ක් සහ සියයට 5.8 ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. නිමැවුම් කර්මාන්ත අතුරෙන් “පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන” සියයට 94.8 ක ඉහළ වර්ධනයක් වාර්තා කර ඇත. තව ද “ගෘහ

භාණ්ඩ නිෂ්පාදන", "ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදන", "රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන" සහ "රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන" පිළිවෙලින් සියයට 5.7 ක්, සියයට 2.3 ක්, සියයට 1.9ක් සහ සියයට 1.6 ක් වශයෙන් වර්ධනය වී ඇත. කෙසේ වෙතත් "දැව හා දැවමය නිෂ්පාදන", "කඩදාසි නිෂ්පාදන" සහ "මූලික ලෝහ හා ව්‍යුවහාත්මක ලෝහ නිෂ්පාදන" වාර්තා කර ඇත්තේ පිළිවෙලින් සියයට 23.0 ක්, සියයට 11.2 ක් සහ සියයට 10.5ක් වශයෙන් සෘණ වර්ධන වේගයන් ය. මේ අතර "විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම" සහ "ජලය එක්රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීම" පිළිවෙලින් සියයට 0.6ක් සහ සියයට 6.4ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

2019 වර්ෂයේ පළමු කාර්තුවේ දී සේවා ආර්ථික කටයුතු අතුරෙන් "විදුලි සංදේශ සේවා" සහ "තොරතුරු තාක්ෂණ සේවා" පිළිවෙලින් සියයට 15.1ක් සහ සියයට 11.7ක් වශයෙන් ඉහළ වර්ධන වේගයන් වාර්තා කර ඇත. එසේ ම "මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවා", "ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන කාර්යයන්" "රක්ෂණ සේවා","අනෙකුත් පෞද්ගලික සේවා", "ආහාර හා නවාතැන් පහසුකම් සැපයීම", "තොග හා සිල්ලර වෙළඳාම" සහ"ප්‍රවාහනය" පිළිවෙලින් සියයට 9.8ක් , සියයට 8.1 ක් , සියයට 8.0 ක්, සියයට 4.6 ක්, සියයට 4.5 ක්, සියයට 4.4 ක් සහ සියයට 1.8 ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

2019 පළමු කාර්තුවට අදාල ජාතික ගිණුම් ඇස්තමේන්තු පිළිබඳව විස්තරාත්මක තොරතුරු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ www.statistics.gov.lk වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කොට ඇති බව දෙපාර්තමේන්තුව පවසයි.

අයි. ආර්. බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.